# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2126/11 - 2019 ජුනි මස 03 වැනි සඳුදා - 2019.06.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(XV)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, (2010 දෙසැම්බර් මස 29 වැනි දින අංක 1686/22 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මඟින් අවසන් වරට සංශෝධිත) 2005 ජූලි මස 08 වැනි දින අංක 1400/24 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය පිහිටුවමින්, ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''සංගීත පීඨය'' යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන ''සංගීත විද්‍යා අධ්‍යයනාංශය'' යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන එකතු කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''7. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය''.

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 ජුනි මස 03 වැනි දින,
කොළඹ දී ය.

06 - 518


1A - PG 4541 — 518 (2019/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*